# සවිස්තරාත්මක තත්ත්ව වාර්තා සාරාංශය

(දිනය - 2026.08.04 වේලාව - 0600 පැය)

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

## 2026.08.03 දින 1800 පැය සිට 2026.08.04 දින 0600 පැය දක්වා තත්ත්ව වාර්තාව

| අ.අ | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. සංඛ්‍යාව | බලපෑමට ලක්වූ පවුල් | බලපෑමට ලක්වූ පුද්ගලයින් | මිය යෑම | තුවාල ලැබූ පුද්ගලයින් | අතුරුදහන් | පූර්ණ නිවාස හානි | අර්ධ නිවාස හානි | ඥාති නිවාස වල සිටින පවුල් | ඥාති නිවාසවල සිටින | ආරක්ෂිත ස්ථාන | පවුල් සංඛ්‍යාව | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | මහනුවර | 10 | 37 | 137 | 01 | - | - | - | 35 | - | - | - | - | - |
| 02 | නුවරඑළිය | 06 | 584 | 2334 | 04 | 03 | 02 | | 27 | | | 08 | 435 | 1744 |
| 03 | කෑගල්ල | 07 | 127 | 428 | | | | | 46 | | | 01 | 44 | 137 |
| 04 | මාතලේ | 03 | 05 | 11 | | | | | 05 | | | | | |
| 05 | මාතර | 10 | 16 | 61 | | | | | 16 | | | | | |
| එකතුව | | 36 | 769 | 2971 | 05 | 03 | 02 | - | 129 | - | - | 09 | 479 | 1881 |

| සමස්ථ ආපදා විස්තරය Island-wide Total Incidents Summary | සංඛ්‍යාව |
|---|---|
| • බලපෑමට ලක් වූ දිස්ත්‍රික් සංඛ්‍යාව | 05 |
| • බලපෑමට ලක් වූ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 36 |
| • බලපෑමට ලක් වූ මුළු පවුල් සංඛ්‍යාව | 769 |
| • බලපෑමට ලක් වූ මුළු පුද්ගල සංඛ්‍යාව | 2971 |
| • මියයෑම | 05 |
| • තුවාල ලැබූ සංඛ්‍යාව | 03 |
| • අතුරුදහන් | 02 |
| • නිවාස පූර්ණ හානි සංඛ්‍යාව | - |
| • නිවාස අර්ධ හානි සංඛ්‍යාව | 129 |
| • සුරක්ෂිත මධ්‍යස්ථාන සංඛ්‍යාව | 09 |
| • සුරක්ෂිත මධ්‍යස්ථානයන්හි සිටින මුළු පවුල් සංඛ්‍යාව | 479 |
| • සුරක්ෂිත මධ්‍යස්ථානයන්හි සිටින මුළු පුද්ගල සංඛ්‍යාව | 1881 |
| • ඥාති නිවාස වල සිටින මුළු පවුල් සංඛ්‍යාව | - |
| • ඥාති නිවාස වල සිටින මුළු පුද්ගල සංඛ්‍යාව | - |

## වාර්තා වූ මියයෑම් පිළිබඳ විස්තර

| අනු. | දිස්ත්‍රික්කය | දිනය | ආපදාව | ප්‍රා.ලේ.කො | ස්ත්‍රී / පුරුෂ භාවය | සංඛ්‍යාව | වයස |
|---|---|---|---|---|---|---|---|
| 01 | මහනුවර | 2026.08.03 | කණ්ඩි කඩා වැටීම් | නාවලපිටිය | පුරුෂ | 01 | අවු 65 |
| 02 | නුවරඑළිය | 2026.08.03 | නායයෑම් | අඹගමුව | පුරුෂ 01<br>ගැහැණු 03 | 04 | |
| මුළු සංඛ්‍යාව | | | | | | 05 | |

## 2026.08.03 දින 1800 පැය සිට 2026.08.04 දින 0600 පැය දක්වා සිද්ධි වාර්තාව

| විශේෂ සිදුවීම් වාර්තා වී නොමැත. |
|---|

## දිට්වා සුළිකුණාටුව හේතුවෙන් ස්ථාපිත කරන ලද මධ්‍යස්ථාන පිළිබඳ විස්තරය

- බදුල්ල දිස්ත්‍රික්කයේ සුරක්ෂිත මධ්‍යස්ථාන 13 ක පවුල් 369 (පුද්ගලයින් 1003)
- කොළඹ දිස්ත්‍රික්කයේ සුරක්ෂිත මධ්‍යස්ථාන 02 ක පවුල් 18 (පුද්ගලයින් 61)
- කෑගල්ල දිස්ත්‍රික්කයේ සුරක්ෂිත මධ්‍යස්ථාන 02 ක පවුල් 43 (පුද්ගලයින් 133)
- නුවරඑළිය දිස්ත්‍රික්කයේ සුරක්ෂිත මධ්‍යස්ථාන 01 ක පවුල් 35 (පුද්ගලයින් 140)

*මූලාශ්‍ර - NDRSC Report – 2026.07.13*

## කාලගුණ නිවේදනය

**2026 අගෝස්තු මස 04 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2026 අගෝස්තු මස 04 දින උදෑසන 05.30 ට නිකුත්කරන ලදි.**

**බස්නාහිර, සබරගමුව, සහ වයඹ පළාත්වලත් මහනුවර, නුවරඑළිය, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වන අතර, එම ප්‍රදේශවල අහස වලාකුළින් බරව පවතිනු ඇත.**

සබරගමුව පළාතේ සහ මහනුවර, නුවරඑළිය දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථාන වලට **මි.මී 75** ට වැඩි තද වැසි ඇති විය හැක.

උතුරු-මැද පළාතේ වැසි වාර කිපයක් ඇති වේ.

ඌව සහ නැගෙනහිර පළාත්වල සහ මුලතිව් දිස්ත්‍රික්කයේ පස්වරු 2.00 න් පසුව තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

උතුරු-මැද, සබරගමුව, දකුණු, මධ්‍යම සහ වයඹ පළාත්වල සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ විටින් විට හමන **පැ.කි.මී. (40-50)** ක පමණ තද සුළං ඇතිවිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ නිවේදනය

# තද සුළං සහ රළු මුහුදු ප්‍රදේශ පිළිබඳව අනතුරු ඇඟවීමේ නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**

2026 අගෝස්තු මස 04 වන දින ප.ව. 8.00 වන තෙක් වලංගු වන පරිදි

2026 අගෝස්තු මස 03 වන දින ප.ව. 8.00 ට නිකුත් කරන ලදි.


ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ සඳහා

## ක්‍රියාත්මක වන්න!

**ගාල්ල සිට සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. (60-70) දක්වා වැඩි වන අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු වේ. එබැවින්, මෙම මුහුදු ප්‍රදේශයට නැවත දැනුම්දෙන තුරු යාත්‍රා නොකරන ලෙස නාවික සහ ධීවර ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**

**පුත්තලම සිට කොළඹ හරහා ගාල්ල දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. (50-60) දක්වා වැඩි වන අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ.**

**එබැවින් මෙම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතුවල යෙදන ධීවර සහ නාවික ප්‍රජාව මේ පිළිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙසත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන ඉදිරි නිවේදන පිළිබඳව, අවධානයෙන් පසුවන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.**




<u>ගත් ක්‍රියාමාර්ගය</u>

- DEWN SMS මගින් හඳුනාගත් පුද්ගලයන් 35,000 දෙනෙකු දැනුවත් කිරීම සිදුකරන ලදි.
- WhatsApp මගින් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන දැනුවත් කිරීම සිදුකරන ලදි.
- Email මගින් පාර්ශවකාර ආයතන වෙත දැනුවත් කිරීම සිදුකරන ලදි.
- මෙම නිවේදනය DMC වෙබ් අඩවියේ යාවත්කාලීන කර ඇත.
- මාධ්‍ය දැනුවත් කිරීමට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි.

තද සුළං පිළිබඳ අවවාදාත්මක නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**

2026 අගෝස්තු මස 04 දින පෙ.ව. 11.30 වන තෙක් වලංගු වන පරිදි


2026 අගෝස්තු මස 03 දින පෙ.ව. 11.30 ට නිකුත් කරන ලදි.

---

**උතුරු-මැද, වයඹ, සබරගමුව, මධ්‍යම සහ දකුණු පළාත් සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය සඳහා**

## සූදානම් වන්න!

**දිවයින හරහා පවතින සක්‍රීය නිරිතදිග මෝසම් තත්ත්වය හේතුවෙන් උතුරු-මැද, වයඹ, සබරගමුව, මධ්‍යම සහ දකුණු පළාත් වලත්, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේත් විටින් විට හමන පැ.කි.මී. (40-50) ක පමණ තද සුළං ඇතිවිය හැක.**




**<u>ගත් ක්‍රියා මාර්ගය</u>**

- DEWN SMS මගින් හඳුනාගත් පුද්ගලයන් 35,000 දෙනෙකු දැනුවත් කිරීම සිදුකරන ලදි.
- WhatsApp මගින් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන දැනුවත් කිරීම සිදුකරන ලදි.
- Email මගින් පාර්ශවකාර ආයතන වෙත දැනුවත් කිරීම සිදුකරන ලදි.
- මෙම නිවේදනය DMC වෙබ් අඩවියේ යාවත්කාලීන කර ඇත.
- මාධ්‍ය දැනුවත් කිරීම සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි.


## තද වැසි පිළිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2026 අගෝස්තු මස 04 වන දින පෙ. ව 11.30 දක්වා වලංගු වන පරිදි
2026 අගෝස්තු මස 03 වන දින පෙ. ව 11.30 නිකුත් කරන ලදී.

---

### සබරගමුව පළාත සහ මහනුවර, නුවරඑළිය, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක සඳහා

## සූදානම් වන්න!




**පවතින සක්‍රීය නිරිත දිග මෝසම හේතුවෙන්, දිවයිනේ නිරිතදිග ප්‍රදේශවල දැනට පවතින වැසි සහ සුළං තත්ත්වය ඉදිරි පැය 24 තුළදී තවදුරටත් පවතී.**

**සබරගමුව පළාතේ සහ මහනුවර, නුවරඑළිය, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථානවලට මිලිමීටර් 100 ට වැඩි තද වැසි ඇති විය හැක.**

**2026.08.02 පෙ.ව 8.30 සිට 2026.08.03 දින පෙ.ව 8.30 දක්වා කාලය තුල වාර්තාවූ වර්ෂාපතන අගයන් පහත දක්වා ඇත.**

| වර්ෂාමාන මධ්‍යස්ථානය | දිස්ත්‍රික්කය | වර්ෂාපතනය ( මි.මී ) |
|---|---|---|
| කැනියන් | නුවර එළිය | 191.0 |
| ලක්ෂපාන | නුවර එළිය | 187.0 |
| නෝටන් | නුවර එළිය | 186.0 |
| කාසල්රී | නුවර එළිය | 159.0 |
| කොත්මලේ | නුවර එළිය | 133.2 |
| දික්ඔය | නුවර එළිය | 127.0 |

**<u>ගත් ක්‍රියා මාර්ගය</u>**

- DEWN SMS මගින් හඳුනාගත් පුද්ගලයන් 35,000 දෙනෙකු දැනුවත් කිරීම් සිදුකරන ලදි.
- WhatsApp මගින් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන දැනුවත් කිරීම් සිදුකරන ලදි.
- Email මගින් පාර්ශවකාර ආයතන වෙත දැනුවත් කිරීම් සිදුකරන ලදි.
- මෙම නිවේදනය DMC වෙබ් අඩවියේ යාවත්කාලීන කර ඇත.
- මාධ්‍ය දැනුවත් කිරීම සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි.

**නායයෑම් පිළිබඳ අවවාදත්මක නිවේදනය 2026.08.03 දින 1200 පැයට (2026.08.04 දින 1200 පැය දක්වා )**

| දිස්ත්‍රික්කය | විමසිලිමත් මට්ටම (කහ) | අවදානම් මට්ටම (ඇම්බර්) | ඉවත්වීම (රතු) |
|---|---|---|---|
| මහනුවර | | දොළුව, උඩපළාත, දෙල්තොට, මැදදුම්බර, පන්විල | උඩුදුම්බර,පස්බාගේකොරලේ, ගඟඉහළ කොරලේ |
| කෑගල්ල | කෑගල්ල | දැරණියගල, බුලත්කොහුපිටිය, අරණායක, දෙහිඕවිට | යටියන්තොට |
| නුවරඑළිය | හඟුරන්කෙත | නුවරඑළිය, කොත්මලේ නැගෙනහිර, කොත්මලේ බටහිර | අඹගමුව හා නෝර්වුඩ් |
| රත්නපුර | කුරුවිට, නිවිතිගල | ඕපනායක, රත්නපුර,ඉඹුල්පෙ | |

<u>ගත් ක්‍රියා මාර්ගය</u>

- DEWN SMS මගින් හඳුනාගත් පුද්ගලයන් 35,000 දෙනෙකු දැනුවත් කිරිම් සිදුකරන ලදි.
- WhatsApp මගින් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන දැනුවත් කිරිම් සිදුකරන ලදි.
- Email මගින් පාර්ශවකාර ආයතන වෙත දැනුවත් කිරිම් සිදුකරන ලදි.
- මෙම නිවේදනය DMC වෙබ් අඩවියේ යාවත්කාලීන කර ඇත.
- මාධ්‍ය දැනුවත් කිරිම සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි.

**ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන**

2026.08.05 දින ප.ව 1.00 දක්වා වලංගුවේ.
Valid till 1.00 PM on 5th of August 2026

**Time :- 1.00 PM**
**වේලාව :- ප.ව. 1.00**

| | | |
|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 01 | වර්ණය - රතු |
| **Flood Warning Message :** | **Number - 01** | Colour – Red |

<u>මහවැලි ගඟ ද්‍රෝණිය - **Mahaweli River Basin**</u>

මහවැලි ගඟෙහි ඉහළ ධාරා ප්‍රදේශවලට පසුගිය පැය කිහිපය තුළ ලැබුණු වර්ෂාපතනය, ඉදිරියේදී වර්ෂාපතනය තවත් ලැබීය හැකි බවට වන පුරෝකථන හා කොත්මලේ ජලාශයේ වාන් දොරටු විවර කිරීමේ අවධානම හේතුවෙන් **මහවැලි ගඟ ද්‍රෝණියේ උඩුනුවර, උඩපළාත, යටිනුවර, දොලුව, කොත්මලේ, පස්බාගේ, ගඟඉහළ කෝරළය, පස්බාගේ කොරළේ, ගඟවට කෝරළය, හාරිස්පත්තුව සහ පාතදුම්බර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් මහවැලි ගඟ ආශ්‍රිත පහත් බිම් ප්‍රදේශවලට මෙතැන් සිට ඉදිරි පැය 48ක කාලය තුළ මහ ගංවතුර තත්ත්වයක් ඇතිවීමේ අවධානමක් පවතී.** එසේම එම ප්‍රදේශවල මහවැලි ගඟට ආසන්නව පහත් බිම් ආශ්‍රිතව පදිංචි මහජනතාවගෙන් ඒ සම්බන්ධව දැඩි විමසිල්ලෙන් පසුවන ලෙසත්, ඇතිවිය හැකි ගංවතුර තත්ත්වයකින් ආරක්ෂාවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ. **මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමණාකරන අංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.** ඉදිරියේදී තවදුරටත් වැසි ලැබීම අපේක්ෂා කරන බැවින් මෙ පිළිබඳවා ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉතා ඕනෑකමින් මහජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

Time :- 2.00 PM
වේලාව :- ප.ව. 2.00

2026.08.04 දින ප.ව 2.00 දක්වා වලංගුවේ.
Valid till 2.00 PM on 04th of August 2026

| | | |
|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක - 01 | වර්ණය - ඇම්බර් |
| **Flood Warning Message :** | **Number - 01** | Colour – Amber |

## කළු ගඟ ද්‍රෝණිය - Kalu River Basin

කළු ගඟ ද්‍රෝණිය වෙත මේ වන විට ලැබී පවතින අධික වර්ෂාපතනය හා කළු ගඟ ද්‍රෝණිය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් නඩත්තු කරනු ලබන ජලමාපක දත්ත විශ්ලේෂණය අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ **පැල්මඩුල්ල, නිවිතිගල, රත්නපුර, කුරුවිට, අයගම, ඇලපාත** යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල කළු ගඟ පිටාර තැන්නට අයත් පහත් බිම් ප්‍රදේශවලට ඉදිරි පැය කිහිපය තුළ සුළු ගංවතුර තත්ත්වයක් ඇතිවන බවට මෙයින් අනතුරු අඟවනු ලැබේ. මෙම තත්ත්වය සම්බන්ධයෙන් දැඩි අවධානයකින් කටයුතු කරන ලෙස එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන් සහ එම ප්‍රදේශ හරහා ගමන් ගන්නා රියදුරන් හා මගීන්ගෙන්ද ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශ වලින් ද ඉල්ලා සිටිනු ලැබේ.

Time :- 3.30 PM
වේලාව :- ප.ව. 3.30

2026.08.04 දින ප.ව 3.30 දක්වා වලංගුවේ.
Valid till 3.30 PM on 4th of August 2026

| | | |
|---|---|---|
| ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදන : | අංක 04 | වර්ණය - ඇම්බර් |
| **Flood Warning Message :** | **Number 04** | Colour – Amber |

## කැළණි ගඟ ද්‍රෝණිය - Kelani River Basin

කැළණි ගඟ ද්‍රෝණියේ ඉහල සහ මධ්‍යම ධාරා ප්‍රදේශවලට මේ වනවිට වැඩි තීව්‍රතාවයකින් යුතුව සැළකියයුතු වර්ෂාපතනයක් ලැබී ඇත. එම වර්ෂා තත්ත්වය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් කැළණි ගඟ ද්‍රෝණිය තුළ නඩත්තු කරනු ලබන ගංඟා ජල මාපකවල ජල මට්ටම් විශ්ලේෂණය අනුව ඉදිරි පැය 24 කාලය තුළ **දොම්පේ, සීතාවක, හෝමාගම, කඩුවෙල, බියගම සහ කොළොන්නාව** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් කැළණි ගංඟා නිම්නයේ පහත්බිම් ප්‍රදේශවලට සුළු ගංවතුර තත්ත්වයක් ඇතිවිය හැකි බවට අනතුරු අඟවනු ලැබේ. එසේම පවතින පුරෝකථනයන් අනුව ඉදිරියේදී අධි තීව්‍රතාවයකින් යුතුව වර්ෂාව ඇති විය හැකි බැවින් ගඟෙහි ජලමට්ටම් ක්ෂණිකව ඉහල යා හැකි නිසා මේ තත්ත්වය සම්බන්ධයෙන් දැඩි සැලකිල්ලකින් කටයුතු කරන ලෙස එම ප්‍රදේශවල පදිංචි මහජනතාවගෙන්, ගංඟාව පරිහරණය කරන්නන්ගෙන් සහ ප්‍රදේශ හරහා ගමන් ගන්නා වාහන පදවන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස ආපදා කළමනාකරණ අංශ වලින් ඉල්ලා සිටිනු ලැබේ.

**ගත් ක්‍රියා මාර්ගය**

- DEWN SMS මගින් හඳුනාගත් පුද්ගලයන් 35,000 දෙනෙකු දැනුවත් කිරීම සිදුකරන ලදි.
- WhatsApp මගින් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන දැනුවත් කිරීම සිදුකරන ලදි.
- Email මගින් පාර්ශවකාර ආයතන වෙත දැනුවත් කිරීම සිදුකරන ලදි.
- මෙම නිවේදනය DMC වෙබ් අඩවියේ යාවත්කාලීන කර ඇත.
- මාධ්‍ය දැනුවත් කිරීම සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි.

## ප්‍රධාන ගංගා ආශ්‍රිත ජල මට්ටම්

වාරිමාර්ග දෙපාර්තමේන්තුව
நீர்ப்பாசனத் திணைக்களம்
IRRIGATION DEPARTMENT
(ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ අංශය)

### Islandwide Water Level & Rainfall Situation in Major Rivers

**DATE :** 4-Aug-2026 **TIME :** 3:30 AM

| River Basin | Tributory/River | Gauging Station | | | | | Water Level at 2:00 am | Water Level at 3:00 am | Remarks | Water Level Rising or Falling | 18 Hr RF in mm at 3:00 am |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Station | Unit | Alert Level | Minor Flood Level | Major Flood Level | | | | | |
| Kelani Ganga (RB 01) | Kelani Ganga | Nagalagam Street | ft | 4.00 | 5.00 | 7.00 | 3.30 | 3.60 | Normal | | - |
| | Kelani Ganga | Hanwella | m | 7.00 | 8.00 | 10.00 | 7.15 | 7.17 | Alert | Rising | 4.1 |
| | Kelani Ganga | Glencourse | m | 15.00 | 15.50 | 19.00 | 16.00 | 15.81 | Minor Flood | Falling | 15.7 |
| | Kelani Ganga | Kithulgala | m | 3.00 | 4.00 | 6.00 | 2.82 | 2.77 | Normal | | 125.8 |
| | Gurugoda Oya | Holombuwa | m | 3.00 | 3.40 | 5.00 | 1.44 | 1.40 | Normal | | 12.4 |
| | Seethawaka Ganga | Deraniyagala | m | 4.80 | 5.80 | 6.40 | 1.62 | 1.67 | Normal | | 37.3 |
| | Kehelgamu Oya | Norwood | m | 1.50 | 3.00 | 4.50 | 1.45 | 1.45 | Normal | | 129.2 |
| Kalu Ganga (RB 03) | Kalu Ganga | Putupaula | m | 3.00 | 4.00 | 5.00 | 1.78 | 1.80 | Normal | | 1.2 |
| | Kalu Ganga | Ellagawa | m | 10.00 | 10.70 | 12.20 | 8.33 | 8.35 | Normal | | 10.8 |
| | Kalu Ganga | Rathnapura | m | 5.20 | 7.50 | 9.50 | 7.71 | 7.65 | Minor Flood | Falling | 63.4 |
| | Maguru Ganga | Magura | m | 4.00 | 6.00 | 7.50 | 3.44 | 3.04 | Normal | | 23.1 |
| | Kuda Ganga | Kalawellawa (Millakanda) | m | 5.00 | 6.50 | 8.00 | 5.08 | 5.10 | Alert | Rising | 4.7 |
| Gin Ganga (RB 09) | Gin Ganga | Baddegama | m | 3.50 | 4.00 | 5.00 | 2.43 | 2.48 | Normal | | 2.0 |
| | Gin Ganga | Thawalama | m | 4.00 | 6.00 | 7.50 | 3.22 | 3.06 | Normal | | 26.0 |
| Nilwala Ganga (RB 12) | Nilwala Ganga | Thalgahagoda | m | 1.40 | 1.70 | 2.80 | 0.82 | 0.82 | Normal | | 15.6 |
| | Nilwala Ganga | Panadugama | m | 5.00 | 6.00 | 7.50 | 4.82 | 4.75 | Normal | | 29.9 |
| | Nilwala Ganga | Pitabeddara | m | 4.00 | 5.00 | 6.50 | 2.08 | 1.99 | Normal | | 22.2 |
| | Urubokka Ganga | Urawa | m | 2.50 | 4.00 | 6.00 | 0.85 | 0.81 | Normal | | 31.6 |
| Walawe Ganga (RB 18) | Walawe Ganga | Moraketiya | m | 3.00 | 5.00 | 7.00 | 1.29 | 1.25 | Normal | | 0.0 |
| Kirindi Oya (RB 22) | Kirindi Oya | Thanamalwila | m | 4.00 | 5.00 | 5.50 | 0.11 | 0.11 | Normal | | 0.0 |
| | Kirindi Oya | Wellawaya | m | 4.40 | 5.40 | 5.90 | 0.50 | 0.51 | Normal | | 1.0 |
| | Kuda Oya | Kuda Oya | m | 6.90 | 8.40 | 8.80 | 0.95 | 0.95 | Normal | | 0.0 |
| Menik Ganga (RB 26) | Menik Ganga | Katharagama | m | 4.00 | 4.60 | 6.50 | -0.22 | -0.22 | Normal | | 1.2 |
| Kumbukkan Oya (RB 31) | Kumbukkan Oya | Nakkala | m | 5.00 | 6.00 | 7.50 | 0.57 | 0.57 | Normal | | 0.0 |
| Heda Oya (RB 36) | Heda Oya | Siyambalanduwa | m | 4.50 | 6.00 | 7.00 | 0.19 | 0.19 | Normal | | 0.6 |
| Maduru Oya (RB 54) | Maduru Oya | Padiyathalawa | m | 4.00 | 4.50 | 6.00 | 0.10 | 0.10 | Normal | | 0.5 |
| Mahaweli Ganga (RB 60) | Mahaweli Ganga | Manampitiya | m | 3.00 | 4.30 | 6.00 | -0.11 | -0.08 | Normal | | 0.0 |
| | Mahaweli Ganga | Weraganthota | m | 5.00 | 6.00 | 8.00 | - | - | | | 1.2 |
| | Mahaweli Ganga | Peradeniya | m | 5.00 | 7.00 | 9.00 | 6.68 | 6.20 | Alert | Falling | 43.5 |
| | Mahaweli Ganga | Nawalapitiya | m | 3.50 | 5.00 | 6.00 | 2.85 | 2.78 | Normal | | 122.0 |
| | Badulu Oya | Thaldena | m | 3.00 | 4.00 | 5.00 | 0.19 | 0.24 | Normal | | 3.3 |
| Yan Oya (RB 67) | Yan Oya | Horowpothana | m | 6.00 | 7.50 | 10.50 | 1.20 | 1.20 | Normal | | 0.0 |
| Maa Oya (RB 69) | Mukunu Oya | Yaka Wewa | m | 4.00 | 5.00 | 6.00 | 0.42 | 0.42 | Normal | | 0.0 |
| Malwathu Oya (RB 90) | Malwathu Oya | Thanthirimale | m | 5.00 | 6.80 | 7.80 | - | - | | | 0.0 |
| Mee Oya (RB 95) | Mee Oya | Galgamuwa | m | 4.84 | 5.94 | 8.00 | - | - | | | 0.0 |
| Deduru Oya (RB 99) | Deduru Oya | Moragaswewa | m | 4.75 | 6.00 | 7.00 | -0.01 | -0.01 | Normal | | 0.0 |
| Maha Oya (RB 102) | Maha Oya | Badalgama | m | 5.00 | 6.20 | 9.60 | 4.65 | 4.76 | Normal | | 2.5 |
| | Maha Oya | Giriulla | m | 5.50 | 6.50 | 7.50 | 3.65 | 3.20 | Normal | | 4.5 |
| Attanagalu Oya (RB 103) | Attanagalu Oya | Dunamale | m | 3.30 | 4.40 | 5.50 | 1.57 | 1.64 | Normal | | 1.5 |

## වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ප්‍රධාන ජලාශ ආශ්‍රිත වාන් දොරටු විවෘත කිරීම්

| අ.අ. | ජලාශය | ගඟ / ඔය | දිස්ත්‍රික්කය | වාන් දොරටු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | පොල්පිටිය | කැළණි ගඟ | මහනුවර | වාන් දොරටු 01 ක් සෙ.මී. 60 බැගින් සහ වාන් දොරටු 01 ක් සෙ.මී. 143 බැගින් විවෘත කර ඇත. |
| 02 | පොල්ගොල්ල | පොල්ගොල්ල ජලාශය | මහනුවර | වාන් දොරටු 08 ක් මීටර් 04 බැගින් විවෘත කර ඇත. |
| 03 | කැනියන් | මස්කෙලි ඔය | නුවරඑළිය | වාන් දොරටු 02 ක් අඟල් 06 බැගින් විවෘත කර ඇත. |

(මූලාශ්‍ර - වාරිමාර්ග දෙපාර්තමේන්තුව)

## 2026.08.04 දින 0600 පැයෙන් අවසන් පැය 12 තුළ වර්ෂාපතන දත්ත

| ස්ථානය | දිස්ත්‍රික්කය | වර්ෂාපතනය (මි.මී) | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිලධාරි වසම |
|---|---|---|---|---|
| වටවල | නුවරඑළිය | 200.20 | අඹගමුව | වටවල |
| හැටන් | නුවරඑළිය | 131.20 | අඹගමුව | හැටන් |
| නෝර්ටන් | නුවරඑළිය | 208.00 | අඹගමුව | කිරිවනැලිය |
| බගවන්තලාව | නුවරඑළිය | 80.80 | අඹගමුව | කොටියාගල |
| ගවරවිල | නුවරඑළිය | 95.80 | අඹගමුව | ගවරවිල |
| හඟුරන්කෙත | නුවරඑළිය | 92.60 | හඟුරන්කෙත | හඟුරන්කෙත |
| හුණුගල්ඔය | නුවරඑළිය | 123.80 | කොත්මලේ | තැලිස්සගල |
| කොටගල | නුවරඑළිය | 98.40 | නුවරඑළිය | කුඩාඔය |
| ලෙතන්ටි තේ කම්හල | නුවරඑළිය | 140.80 | අඹගමුව | ලෙතන්ටි |
| මහනිලු තේ කම්හල | නුවරඑළිය | 103.00 | අඹගමුව | මහනිලු |
| නොර්වුඩ් | නුවරඑළිය | 116.00 | අඹගමුව | නොර්වුඩ් |
| දොලොස්බාගේ | මහනුවර | 170.00 | ගඟ ඉහල කෝරළය | මියනගොල්ල |
| දස්කර | මහනුවර | 87.20 | උඩුනුවර | හත්නාගොඩ |
| ගලහ | මහනුවර | 117.40 | දෙල්තොට | ගලහ |
| කුරුඳුවත්ත | මහනුවර | 128.20 | ගඟ ඉහල කෝරළය | මල්වත්තගම |
| මොරහේන | මහනුවර | 103.40 | දොළුව | තුම්පෙලාවක |
| නිල්ලඹේ | මහනුවර | 120.40 | දොළුව | නිල්ලඹේ |
| උඩිස්පත්තුව | මහනුවර | 80.40 | මැදදුම්බර | කුරුකොහගම |
| උලපනේ | මහනුවර | 111.00 | ගඟ ඉහල කෝරළය | උලපනේ උතුර |
| නාවලපිටිය | මහනුවර | 131.00 | පස්බාගෙකෝරලේ | නාවලපිටිය දකුණ |
| දෝතල්ඔය | කෑගල්ල | 146.00 | අරණායක | ගංතුන මැදගම |
| හෙම්මාතගම | කෑගල්ල | 97.40 | මාවනැල්ල | ගිනිහප්පිටිය |
| දැරණියගල | කෑගල්ල | 87.40 | දැරණියගල | බස්නාගල |
| කිතුල්ගල | කෑගල්ල | 138.80 | යටියන්තොට | කළුකොහුතැන්න |
| දොලොස්වල | රත්නපුර | 80.00 | නිවිතිගල | දොලොස්වල |
| ඕපනායක | රත්නපුර | 77.80 | ඕපනායක | මැටිහක්වල |
| ගලබඩ | රත්නපුර | 77.60 | රත්නපුර | ගලබඩ |
| පලාබද්දල | රත්නපුර | 97.20 | රත්නපුර | සිරිපාගම |
| වලේබොඩ | රත්නපුර | 74.20 | ඉඹුල්පේ | කට්ටඩිකන්ද |
| වේවැල්වත්ත | රත්නපුර | 104.00 | රත්නපුර | බඹරබොටුව |

(මූලාශ්‍ර - Automated rain Gauges NBRO / MET)

## 2026.08.04 දින 0600 පැයට මාර්ග අවහිරවී ඇති ස්ථාන

1. **දිස්ත්‍රික්කය - මාතලේ**
   **මාර්ගය** - දිට්වා සුළිකුණාටුවෙන් හානි වු රිවස්ටර්න් ප්‍රදේශයේ මාර්ග මේ වන විට සැහැල්ලු වාහන ගමනා ගමනයට පමණක් විවෘත කර ඇත.

2. **දිස්ත්‍රික්කය - කැගල්ල**
   **මාර්ගය** -
   1. කැගල්ල, බුලත්කොහුපිටිය- කැන්දලතැන්න පාලම කැඩී යාම හේතුවෙන් කැන්දලතැන්න ග්‍රාමයේ **ගමනාගමනයට බාධා ඇතිවී ඇත.**
   2. ක්ෂණික ගංවතුර හේතුවෙන් හැටන් - කිතුල්ගල - කොළඹ මාර්ගයේ **තැලිගමින් යටවී ඇත.**

## 2026.08.04 දින 0600 පැයට දුම්රිය මාර්ග අවහිරවී ඇති ස්ථාන

1. දුම්රිය මාර්ගය - **උඩරට දුම්රිය මාර්ගය**
   දුම්රිය මාර්ග අවහිරවී ඇති ස්ථාන - රඹුක්කන සිට නානුඔය දක්වා දුම්රිය ධාවනය නොවේ.
   (නානුඔය සිට බදුල්ල දක්වා පමණක් ධාවනය වේ.)

*(මූලාශ්‍ර ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව)*



ශාන් පතිරණ
නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජකාරි භාර නිළධාරී
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට